## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය

# ඇබෑර්තු

### උසස් පර්යේෂණ හා අධ්‍යාපන සමායෝජන අධ්‍යයනාංශය (KDU - CARE)
### ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය

**ඇබෑර්තු ගණන : 5**

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයට අයත් ප්‍රමුඛ පර්යේෂණ ආයතනයක් වන උසස් පර්යේෂණ හා අධ්‍යාපන සමායෝජන අධ්‍යයනාංශය (KDU CARE) විසින් පර්යේෂක තනතුරු සඳහා සුදුසුකම් සහිත අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. උසස් පර්යේෂණ හා අධ්‍යාපන සමායෝජන අධ්‍යයනාංශයේ පරමාර්ථය නවීන තාක්ෂණික නවෝත්පාදන සහ වාණිජ කරණීය කළ හැකි පර්යේෂණ ක්‍රියාත්මක කිරීම වේ.

**පර්යේෂණ ක්ෂේත්‍ර :**

තාර්කික රසායනික විද්‍යාව, ජෛවතාක්ෂණ විද්‍යාව, ජෛවරසායන විද්‍යාව, ජෛවතොරතුරු විද්‍යාව සහ සංඛ්‍යාත්මක ජෛව විද්‍යාව, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, ජෛව ද්‍රව්‍ය, ස්වභාවික නිෂ්පාදන රසායනික විද්‍යාව, පටක ඉංජිනේරු විද්‍යාව සහ ජෛව ෆොටෝනික්, ඖෂධ සංවර්ධනය, ඖෂධ නිෂ්පාදන අධීක්ෂණය සහ තත්ත්ව සහතිකය, පිළිකා ජෛව විද්‍යාව, අණුක ජීව විද්‍යාව, ජෛව පිරිසැකසුම්කරණය සහ ජෛව නිෂ්පාදනය හෝ තෝරාගැනීමේ මණ්ඩලය විසින් නිර්දේශ කළ හැකි අනෙකුත් අදාළ ක්ෂේත්‍ර.

අපේක්ෂකයන් විසින් තම අභිමතය පරිදි ක්‍රියාත්මක කිරීමට යෝජනා කරනු ලබන පර්යේෂණ සඳහන් විස්තරයක් (පිටු 1-2) අයදුම්පත්‍රය සමග බාරදීම අත්‍යවශ්‍ය වේ.

**කාර්ය විස්තරය**

**එයට සම්බන්ධ කොන්දේසි පහත පරිදි වේ.**

1. ඉලක්කගත, පරිවර්තන පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
2. ව්‍යාපාර අවශ්‍යතා සඳහා පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
3. පශ්චාත් අධ්‍යයන කටයුතු සඳහා පර්යේෂණ ව්‍යාපෘති ලබා දීම.
4. පර්යේෂණ සඳහා අරමුදල් පර්යේෂණ ප්‍රතිපාදන හෝ ව්‍යාපාර කොටස්කරුවන් මගින් ලබා ගැනීම.
5. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ උසස් පර්යේෂණ හා අධ්‍යාපන සමායෝජන අධ්‍යයනාංශය විසින් ආරම්භ කරන ලද පෞද්ගලික අංශය සමග දැනට ක්‍රියාත්මක වන පර්යේෂණ ව්‍යාපෘති සඳහා දායක වීම.
6. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ උසස් පර්යේෂණ හා අධ්‍යාපන සමායෝජන අධ්‍යයනාංශයේ ව්‍යාපෘති ලබා ගැනීමට අනෙකුත් කාර්ය මණ්ඩල සමග සම්බන්ධවී ක්‍රියා කිරීම.
7. පර්යේෂණ ප්‍රතිඵල පිළිගත් පර්යේෂණ මාධ්‍යයන්හි පලකිරීම/නවෝත්පාදන බලපත්‍ර ලබාගැනීම.
8. පරිවාස කාලයක් සහිතව කාර්ය මණ්ඩලය බඳවා ගනු ලබන අතර අවුරුදු 03ක පරිවාස කාලය අවසන් වූ විට ඔවුන් සේවයේ ස්ථිර කිරීම පහත දක්වා ඇති නිර්ණායක පදනම් කරගනිමින් සිදු කරනු ලැබේ.
    - අ. ව්‍යාපාර කොටස්කරුවන් සමග ක්‍රියාත්මක කරන ලද නව නිපැයුම්/නිෂ්පාදන සංවර්ධන ව්‍යාපෘති ප්‍රමාණය.
    - ආ. ක්‍රියාත්මක කරන ලද පරිවර්තන පර්යේෂණ ව්‍යාපෘති ප්‍රමාණය
    - ඇ. පිටතින් ලබාගත් පර්යේෂණ අරමුදල් ප්‍රමාණය
    - ඈ. ප්‍රකාශයට පත්කරන ලද පර්යේෂණ පත්‍රිකා/ලබාගන්නා ලද නවෝත්පාදන බලපත්‍ර ප්‍රමාණය
    - ඉ. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ උසස් පර්යේෂණ හා අධ්‍යාපන සමායෝජන අධ්‍යයනාංශය සඳහා අධීක්ෂණය කරන ලද පශ්චාත් උපාධි ශිෂ්‍යයන් ප්‍රමාණය

    * ඉහත නිර්ණායක තෘප්තිමත් කිරීමට නොහැකිවූ කාර්යමණ්ඩලය උපරිම වශයෙන් මාස 6 - 12 කාලයක් සඳහා සේවය දීර්ඝ කිරීම හෝ සේවය අත්හිටුවීම කෙරෙනු ඇත.

**වැටුප් ප්‍රමාණය**

වැටුප් පරිමාණ

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය තනතුර – U-AC (1) රු. 91,310 - 7x2,170 - 106,500 p.m
2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 ශ්‍රේණිය තනතුර – U-AC (11) රු. 79,360 - 11x1,630 - 97,290 p.m
3. කථිකාචාර්ය තනතුර (ස්ථිර නොකළ) – U-AC (111) රු. 69,580 - 5x1,630 - 77,730 p.m

**වෙනත් ප්‍රතිලාභ**

සුදුසුකම්ලත් තනතුරු සඳහා සප්තවාර්ෂික නිවාඩු සහ පර්යේෂණ දීමනාව, නොමිලේ සෞඛ්‍ය රක්ෂණාවරණයක්, වාර්ෂික දිරි දීමනා, සේවකයින්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව, විශ්වවිද්‍යාල රෝහලෙහි ප්‍රතිකාර ලබා ගැනීමේ දී ප්‍රමුඛතාවය සහ වෙනත් වරප්‍රසාද

**පොදු කොන්දේසි**

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරුවන් තෝරාගැනීම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පරිපාටියට අනුකූලව සහ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල පදනම් කරගෙන සිදුකරනු ඇත.
3. අයදුම්කරුවන් තෝරා ගැනීම, ඒ ඒ තනතුරෙහි / ශ්‍රේණියෙහි අනුමත ඇබෑර්තු ගණන සම්පූර්ණ වනතෙක් පමණක් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය විසින් සිදුකරනු ඇත.
4. අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ඇත.
5. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණවලට කැඳවීමට පෙර ඔවුන් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලයට ඇත.
6. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් බාගත කරගත හැකි ආකෘතිය මගින් පමණක් අදාළ තනතුර සඳහා ඉල්ලුම් කරන ලෙස අයදුම්කරුවන්ට තරයේ දන්වා සිටිනු ලැබේ. ප්‍රමාදවී ලැබෙන, අසම්පූර්ණ හෝ නියමිත ආකෘතියට පරිබාහිරව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
7. අයදුම්කරුවන් විසින් වෙබ් අඩවියෙන් (www.kdu.ac.lk) බාගත කරගෙන තමා විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාළ සහතිකපත්හි ඡායා පිටපත් සහිතව 2020 අගෝස්තු මස 31 වෙනි දිනට හෝ එදිනට පෙර ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන යන ලිපිනයට එවිය යුතු ය.
8. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ආසන්නතම වැටුප් චක්‍රලේඛය අනුව වැටුප ගෙවනු ලබන අතර වැටුපට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද වෙනත් දීමනා ගෙවනු ලැබේ.
9. ඉල්ලුම්කරුවන් සිය පර්යේෂණ සම්බන්ධ ඉදිරිපත් කිරීමක් (ඉංග්‍රීසි භාෂාවෙන්) කළ යුතුය.
10. ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර ලිවිය යුතුය.
11. සුදුසුකම් සඳහා විශ්වවිද්‍යාල වෙබ් අඩවිය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක. 721, 08/2016, 07/2018 සහ ඒවායේ විශේෂ සටහන් සහ අදාළ සංශෝධන වෙත යොමු වෙන ලෙස අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ.
12. තෝරාගන්නා ලද අපේක්ෂකයින්ට මෙම විශ්වවිද්‍යාලයේ ඕනෑම පරිශ්‍රයක සේවය කිරීමට හා රාජකාරී කිරීමට හැකියාව තිබිය යුතුය.

වැඩිදුර විස්තර සඳහා පිවිසෙන්න :-
**www.kdu.ac.lk.**

අවසාන දිනය
2020.08.31

**අයදුම්පත් එවිය යුතු ලිපිනය :**
ලේඛකාධිකාරී
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
රත්මලාන